Community Resilience to Foreign Interference

# නවසීලන්ත රාජ්‍ය නියෝජිත ආයතන පිළිබඳ තොරතුරු

පහතින් දක්වා ඇති රාජ්‍ය නියෝජිත ආයතන නවසීලන්තයේ ආරක්ෂාව සහ ඔබේ අයිතීන් සුරැකීම සඳහා බැඳීසිටී. මෙම තොරතුරු ඔවුන් කරන දේ සහ ඔබට සහය වීමට ඔවුන්ට කළහැකි දේ පිළිබඳවයි. ඔබට නවසීලන්තයට සිදුවන විදෙස් බලපෑම් පොලීසියට සහ NZSIS වෙත පැමිණිලි කළ හැක. පැමිණිලි කිරීම පිළිඹද වැඩිදුර දැන ගැනීමට: විදෙස් මැදිහත්වීමක් පැමිණිලිකරන්නේ කෙසේද.

---

## New Zealand Police | Ngā Pirihimana o Aotearoa

නවසීලන්ත පොලිසිය විසින් ජනතාවට තම නිවෙස්වල, අපගේ මාර්ගවල සහ ඔවුන්ගේ ප්‍රජාවන් තුළ ආරක්ෂිතව සිටීමට සහ ආරක්ෂිත බවක් දැනීමට හැකි බව සහතික කරන සේවාවන් සපයයි. අපරාධ වැලැක්වීම සහ හානි වැලැක්වීම සහතික කරමින් පැය 24 පුරාවටම පොලීසිය ක්‍රියාත්මකව ඇත. 15,000 ක් පමණ කාර්ය මණ්ඩලයක් සිටින අපි නාගරික හා ග්‍රාමීය ස්ථානවල සහ විශාල පොලිස් මධ්‍යස්ථානවල සේවය සපයයි.

අපි ඇමතුම් 111 වෙත ලැබෙන ඇමතුම් 925,000 කට වඩා සහ හදිසි නොවන ඇමතුම් 743,000 කට වඩා ගොඩබිම, මුහුද සහ ගුවනේ ක්‍රියාත්මක වෙමින් වසරකට සිදුවීම් මිලියන 1.3 කට වඩා ප්‍රතිචාර දක්වන්නෙමු.

පොලිස් කාර්ය මණ්ඩලය නවසීලන්තයේ සිටින සියලුදෙනාටම සහයවීමට සහ ආරක්ෂාකිරීමට පුහුණුව ලබා සිටී. පොලිස් සේවා මානව හිමිකම්වලට ගරු කරන ආකාරයෙන් වන අතර ස්වාධීනව සහ අපක්ෂපාතීව සපයනු ලැබේ.

පොලිසියේ ප්‍රධාන කාර්යභාරයන් අතරට අපරාධ සහ මාර්ග අනතුරු වැළැක්වීම, විමර්ශනය කිරීම, විසඳීම සහ අඩු කිරීම ඇතුළත් වේ. පොලීසියේ කාර්යභාරයන්ට අඩංගු වනුයේ:

- සාමය පවත්වාගැනීම

- මහජන ආරක්ෂාව පවත්වාගැනීම
- නීතිය බලාත්මක කිරීම
- අපරාධ වැලැක්වීම
- ප්‍රජාවන්ට සහය වීම සහ සහයෝගය සහතික කිරීම
- ජාතික ආරක්ෂාව
- නවසීලන්තයෙන් පිටත පොලිස් ක්‍රියාකාරකම්වලට සහභාගීවීම
- හදිසි අවස්ථා කළමනාකරණයන්.

## ජනවාර්ගික සම්බන්ධතා නිලධාරීන්

පොලිසිය රට පුරා ජනවාර්ගික සම්බන්ධතා නිලධාරීන් සිටීමෙන් විවිධත්වය අගය කරන අතර ජනවාර්ගික ප්‍රජාවන්ට සහාය වේ. ඔවුන් ප්‍රජාවන්ට පොලිස් සේවාවන් තේරුම් ගැනීමට සහ ඒවාට ප්‍රවේශ වීමට උපකාර කිරීම, ප්‍රජා ගැටලුගැටලු පිළිබඳව පොලිසියට තොරතුරු සැපයීම සහ වාර්ගික ප්‍රජාවන් සම්බන්ධ අපරාධ විමර්ශනය කිරීම සහ අපරාධ වැළැක්වීම සඳහා පොලිසිය සමඟ කටයුතු කරයි.

අපගේ කාර්ය මණ්ඩලය සැමවිටම ඔබගේ ගැටලුවලට සවන් දීමට සහ ආරක්ෂාව වැඩි දියුණු කිරීම සඳහා ඔබ සමඟ එක්ව කටයුතු කිරීමට කැමැත්තෙන් සිටී.

ඔබට හෝ අන් අයට බියක් ඇති කරන තර්ජන ඔබට පෞද්ගලිකව හෝ අන්තර්ජාලය හරහා එල්ල වුවහොත්, කරුණාකර පොලිසිය අමතන්න. මෙයට ජාතිය, ඇදහීම්, ලිංගික දිශානතිය, ස්ත්‍රී පුරුෂ භාවය, ආබාධිතභාවය හෝ වයස මත පදනම් වූ වෛරය හේතුවෙන් පෙළඹවිය හැකි ඕනෑම සිදුවීමක් ඇතුළත් වේ.

සියලුම නවසීලන්ත වැසියන් තම වටපිටාව පිළිබඳව දැනුවත් විය යුතු අතර සැක සහිත හෝ අසාමාන්‍ය හැසිරීම් බලධාරීන්ට පැමිණිලි කළ යුතු ය.

### 111 පොලිස් හදිසි සේවය: මෙම අවස්ථාවලදී

111 අමතා පොලීසිය ඉල්ලා සිටින්න:

- පුද්ගලයින්ට තුවාල වී හෝ අවදානමක ඇතිවිට; හෝ
- ජීවිතයට හෝ දේපළවලට බරපතල, ක්ෂණික හෝ ආසන්න අවදානමක් තිබේනම්; නැතහොත්, අපරාධයක් සිදුවෙමින් පවතී හෝ සිදු කර ඇති අතර වැරදිකරුවන් තවමත් එම ස්ථානයේ සිටින්නේ හෝ පිටව ගොස් ඇත්නම්.

### 105 පොලිස් හදිසි නොවන පැමිණිලිකිරීම:

හදිසි තත්ත්වයක නොපවතී නම්, පුද්ගලයින්ට සැක සහිත හෝ අසාමාන්‍ය හැසිරීම් ඔවුන්ගේ ප්‍රාදේශීය පොලිසියට පැමිණිලි කළහැකි ක්‍රම වනුයේ:

- 105.police.govt.nz ඔස්සේ මාර්ගගත පැමිණිලිවක් සම්පූර්ණ කිරීම හෝ නවසීලන්ත පොලිසියේ හදිසි නොවන අංකයට 105 දුරකථන ඇමතුමක් ලබා දීම
- ඔවුන්ගේ සමීපතම පොලිස් ස්ථානයට යාම
- 0800 555 111 ඔස්සේ අපරාධ මර්දන නිලධාරීන් අමතන්න

ඔබට පොලීසියට කතාකිරීමට අවශ්‍ය නම්, ඕනෑම ජංගම හෝ ස්ථාවර දුරකථනයකින් 105 අමතන්න. එය 24/7 රට පුරා නොමිලේ ක්‍රියාත්මක සේවාවකි. ඔබට 105 අමතන්න නොහැකි නම්, කරුණාකර https://www.police.govt.nz/use-105 ඔස්සේ මාර්ගගතව අප හා සම්බන්ධ වන්න.

---

**Te Pā Whakamarumaru**
New Zealand Security Intelligence Service

## The New Zealand Security Intelligence Service | Te Pā Whakamarumaru

නවසීලන්ත ආරක්ෂක බුද්ධි සේවය (NZSIS) යනු නවසීලන්තයේ දේශීය ආරක්ෂක බුද්ධි ආයතනයයි. එහි මෙහෙවර වන්නේ නවසීලන්තය සහ මෙහි වෙසෙන සියලු දෙනා ආරක්ෂිතව තබා ගැනීමයි.

NZSIS යනු නවසීලන්තයේ ජාතික ආරක්ෂාවට ඇති තර්ජන විමර්ශනය කරන රාජ්‍ය සේවා දෙපාර්තමේන්තුවකි. මෙයින් අදහස් කරන්නේ නවසීලන්තය නිදහස්, විවෘත සහ ප්‍රජාතන්ත්‍රත්‍රවාදී සමාජයක් ලෙස ආරක්ෂා කිරීමයි. එය නවසීලන්තයේ ජාත්‍යන්තර සබඳතා සහ ආර්ථික යහපැවැත්ම ආරක්ෂා කිරීමට ද උපකාරී වේ.

එය නවසීලන්තයේ දේශීය ආරක්ෂක නියෝජිත ආයතනය වන අතර මානව බුද්ධි අංශ ප්‍රමුඛයා වේ. මෙයින් අදහස් කරන්නේ එම ආයතනය විවිධ පුද්ගලයින් සමඟ කතා කිරීමෙන් තොරතුරු රැස් කරන බවයි. NZSIS විසින් නිපදවන ලද බුද්ධි තොරතුරු රජයට සහ අනෙකුත් ප්‍රතිපත්ති සම්පාදකයින්ට යහපත් තීරණ ගැනීමට සහාය වීම සඳහා සපයනු ලැබේ.

NZSIS හි තවත් කාර්යයක් වන්නේ රාජ්‍ය ආයතන සහ අනෙකුත් ආයතන තම ජනතාව, තොරතුරු සහ වත්කම් ජාතික ආරක්ෂක තර්ජනවලින් ආරක්ෂා කර ගැනීමට උපකාර කිරීමයි.

NZSIS හි අවධානය යොමුකරන ප්‍රධාන අංග වනුයේ:

- බලහත්කාර විදේශ රාජ්‍ය ක්‍රියාකාරකම් මගින් ජනවාර්ගික ප්‍රජාවන් ඉලක්ක කිරීම ඇතුළුව විදේශීය මැදිහත්වීම්.
- ඔත්තු බැලීම
- ප්‍රචණ්ඩ අන්තවාදය සහ ත්‍රස්තවාදය

නවසීලන්ත පොලිසිය සහ රජයේ සන්නිවේදන ආරක්ෂක කාර්යාංශය (GCSB) වැනි දේශීය හවුල්කරුවන් සමඟ NZSIS සමීපව කටයුතු කරයි.  එය එහි මෙහෙවරේ කොටසක් ලෙස ප්‍රජාවන්, අයිවි මාඕරි, පළාත් පාලන ආයතන, අධ්‍යාපන අංශය, ව්‍යාපාර සහ සංවිධාන සමඟ ද කටයුතු කරයි.

එය ක්‍රියාත්මක වන්නේ 2017 බුද්ධි හා ආරක්ෂක පනත නමින් හැඳින්වෙන නීතියක් යටතේ වන අතර එමඟින් NZSIS නීත්‍යානුකූලව ක්‍රියා කරන බවත්, දේශපාලනිකව මධ්‍යස්ථ බවත් සහ මානව හිමිකම් බැඳීම් ආරක්ෂා කරන බවත් සහතික කෙරේ. නවසීලන්ත රජය විසින් නියම කර ඇති බුද්ධි ප්‍රමුඛතාවලට අනුකූලව NZSIS ක්‍රියා කළ යුතුය.

NZSIS හට කිසිවෙකු අත්අඩංගුවට ගැනීමට හෝ රඳවා තබා ගැනීමට නොහැකි අතර, එය පුද්ගලයින්ගේ ඇදහීම්, ජාතිකත්වය හෝ නීත්‍යානුකූල විරෝධතා ක්‍රියාකාරකම්වල යෙදීම නිසා ඔවුන් විමර්ශනවලට ලක් නොකරයි.

සියලුම රාජ්‍ය සේවා දෙපාර්තමේන්තු මෙන්, NZSIS ද ඔම්බුඩ්ස්මන්වරයාට, රහස්‍යතා කොමසාරිස්වරයාට, විගණකාධිපති කාර්යාලයට සහ රාජ්‍ය සේවා කොමිසමට වගකිව යුතුය.

NZSIS බුද්ධි හා ආරක්ෂක පරීක්ෂක ජනරාල්වරයාගේ ශක්තිමත්, ස්වාධීන අධීක්ෂණයට ද යටත් වේ. ඔහුගේ කාර්යභාරය වන්නේ බුද්ධි අංශ නීත්‍යානුකූලව සහ නිසි ලෙස ක්‍රියා කරන බව සහතික කිරීම සඳහා පැමිණිලි විමර්ශනය කිරීම සහ පරීක්ෂණ පැවැත්වීමයි. NZSIS නවසීලන්ත පාර්ලිමේන්තුවට සහ අමාත්‍යවරුන්ට ද වගකිව යුතුය.

**වැඩිදුර තොරතුරු සඳහා:** [Home | New Zealand Security Intelligence Service]

**දැනුවත්ව සිටින්න:** [Engagement | New Zealand Security Intelligence Service]

**ගැටළුවක් වාර්තා කරන්න:** [Reporting a national security concern]

---

**Te Tira Tiaki**
Government Communications
Security Bureau

## The Government Communications Security Bureau | Te Tira Tiaki

රජයේ සන්නිවේදන ආරක්ෂක කාර්යාංශය (GCSB) යනු නවසීලන්තයේ සන්නිවේදන බුද්ධි අංශය සඳහා වන ප්‍රමුඛ ආයතනයයි. මෙමඟින් ඉලෙක්ට්‍රොනික සන්නිවේදන ඔස්සේ ලබාගන්නා තොරතුරු අදහස් කෙරේ.

මෙම බුද්ධි තොරතුරු රජයේ ආයතනවලට ඔවුන්ගේ මෙහෙයුම් සහ තීරණ ගැනීමේදී සහාය වීම සඳහා සපයනු ලබයි. GCSB ආයතනයට විදේශීය හවුල්කරුවන්ගෙන්, විශේෂයෙන් ඕස්ට්‍රේලියාව, ඇමරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය සහ කැනඩාවෙන් බුද්ධි තොරතුරු ලැබේ. GCSB සහ විදේශීය බුද්ධි අංශවල මෙම සංයෝජනය නවසීලන්තයට ලෝකය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට සහ ජාතික ආරක්ෂක තර්ජන කළමනාකරණය කිරීමට උපකාරී වේ.

GCSB තුළ ව්‍යාපාරික ඒකකයක් වන ජාතික සයිබර් ආරක්ෂක මධ්‍යස්ථානය (NCSC) හරහා සයිබර් ආරක්ෂාව සඳහා ප්‍රමුඛ මෙහෙයුම් ආයතනය ද GCSB වේ. NCSC ආයතනය පුද්ගලයන්ගේ සිට කුඩා හා මධ්‍යමධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ සංවිධාන, විශාල ව්‍යවසායන්, රජයේ සහ ජාතික වශයෙන් වැදගත් සංවිධාන දක්වා නවසීලන්තයේ සියලුම දෙනාට සයිබර් ආරක්ෂණ සේවා සපයයි.

[ඔබේ අන්තර්ජාල අයිතිය ලබා ගන්න] යනු පුද්ගලයන්ට සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා සයිබර් ආරක්ෂණ උපදෙස් සහ මග පෙන්වීම සැපයීම කෙරෙහි අවධානය යොමු කරන NCSC හි වෙබ් අඩවියයි. සයිබර් ආරක්ෂණ සිදුවීමක් වාර්තා කිරීමට, [ඔබේ අන්තර්ජාල අයිතිය ලබා ගන්න] හෝ [ජාතික සයිබර් ආරක්ෂණ මධ්‍යස්ථානය] වෙත පිවිසෙන්න.

GCSB නවසීලන්ත ආරක්ෂක බුද්ධි සේවය (NZSIS) සමඟ සමීපව කටයුතු කරයි. NZSIS විසින් නවසීලන්තයේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම, විදේශ මැදිහත්වීම් තර්ජන සහ සියලු ජනතාවට නිදහසේ ජීවත් වීමට සහ කතා කිරීමට ඇති අයිතිය ඇතුළුව නවසීලන්තයේ ජාතික ආරක්ෂාවට ඇති තර්ජන විමර්ශනය කරයි.

GCSB සෑම විටම නවසීලන්ත නීතියට සහ මානව හිමිකම් බැඳීම්වලට අනුකූලව ක්‍රියා කරන බව සහතික කරන බොහෝ ආරක්ෂණ ක්‍රම තිබේ.

නවසීලන්තය නිදහස්, විවෘත සහ ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් ලෙස ආරක්ෂා කරන නීතියක් වන 2017 බුද්ධි හා ආරක්ෂක පනත යටතේ GCSB එහි කාර්යයන් ඉටු කරයි.

GCSB යනු රාජ්‍ය සේවා දෙපාර්තමේන්තුවක් වන අතර, සියලුම රජයේ ආයතන මෙන්, ඔම්බුඩ්ස්මන්, රහස්‍යතා කොමසාරිස්, විගණකාධිපති කාර්යාලය සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට වගකිව යුතුය.  GCSB බුද්ධි හා ආරක්ෂක පරීක්ෂක ජනරාල්වරයාගේ ශක්තිමත්, ස්වාධීන අධීක්ෂණයට ද යටත් වේ.  පොලිස් පරීක්ෂකවරයා බුද්ධි අංශවලට එරෙහි පැමිණිලි විමර්ශනය කරන අතර ඒවා නීත්‍යානුකූලව සහ නිසි ලෙස ක්‍රියා කරන්නේ දැයි පරීක්ෂා කිරීම සඳහා සමාලෝචන සහ විමසීම් පවත්වයි. GCSB නවසීලන්ත පාර්ලිමේන්තුවට සහ අමාත්‍යවරුන්ට ද වගකිව යුතුය.

සේවකයින් 600 ක් පමණ GCSB හි සේවය කරයි. ඔවුන් නවසීලන්තයේ සමාජයේ විවිධ ස්ථානවලින් බඳවාගත් අය වන අතර විවිධ තනතුරුවල සේවය කරති. GCSB සතුව එහි කටයුතු පිළිබඳ වැඩිදුර පැහැදිලි කරන www.gcsb.govt.nz නම් පොදු වෙබ් අඩවියක් ඇත.

---

Te Kāhui Tika Tangata
Human Rights Commission

## Te Kāhui Tika Tangata Human Rights Commission | Te Kāhui Tika Tangata

Te Kāhui Tika Tangata මානව හිමිකම් කොමිසම නවසීලන්තයේ ජාතික මානව හිමිකම් ආයතනයයි (NHRI). “He whakamana tangata. සෑමට ගෞරවනීය ජීවිතයක්” යන්න අපගේ ආදර්ශ පාඨය වන අතර, සියලුම නවසීලන්ත වැසියන්ගේ මානව හිමිකම් ආරක්ෂා කිරීම සහ ශක්තිමත් කිරීම සහ අප කරන සෑම දෙයකටම  Te Tiriti o Waitangi ඇතුළත් කර ඇති බව සංකේතමත් කරයි.

මානව හිමිකම් කොමිසමට කොමසාරිස්වරුන් හතර දෙනෙකු, ස්වදේශික අයිතිවාසිකම් පාලන හවුල්කරුවෙකු සහ ඕක්ලන්ඩ්, වෙලින්ටන් සහ ක්‍රයිස්ට්චර්ච් යන නගරවල පිහිටි කාර්ය මණ්ඩලය 60 ක් පමණ සිටිති.

අපි බොහෝ ආකාරවලින් මානව හිමිකම් ප්‍රවර්ධනය කර ආරක්ෂා කරන්නෙමු. මෙයින් එකක් 1993 මානව හිමිකම් පනත යටතේ නීති විරෝධී වෙනස්කම් කිරීම් පිළිබඳ පැමිණිලි විසඳීමට මහජනතාවට උපකාර කිරීම සඳහා අපගේ නොමිලේ සහ රහසිගත සේවයයි.

අපගේ නඩු උපදේශකයින් සහ මැදිහත්කරුවන් තොරතුරු සැපයීමට, මුල් විසඳුමට සහාය වීමට සහ ආරවුල් විසඳීමේ සේවා ලබා දීමට ජනතාව සමඟ කටයුතු කරයි. අපගේ සේවාවන් නොමිලේ සහ රහසිගතව සපයනු ලැබේ. අපි පැමිණිලි විමර්ශනය කරන්නේ හෝ නීතිය කඩ කර ඇත්දැයි තීරණය කරන්නේ නැත.

ඔබේ ජාතිය, ආගම, ස්ත්‍රී පුරුෂ භාවය, ස්ත්‍රී පුරුෂ භාවය ප්‍රකාශනය, ලිංගික දිශානතිය, ආබාධිතභාවය හෝ වෙනත් පෞද්ගලික ලක්ෂණයක් නිසා ඔබ වෙනස්කම් කිරීම්වලට ලක් වී ඇතැයි ඔබ සිතන්නේ නම් ඔබට පැමිණිල්ලක් කළ හැකි ය.

ඔබ ලිංගික හිරිහැරයකට, අනවශ්‍ය ලිංගික හැසිරීමකට මුහුණ දී ඇත්නම් හෝ යමෙකු ඔබේ ලිංගික දිශානතිය හෝ ස්ත්‍රී පුරුෂ භාවය ප්‍රකාශනය වෙනස් කිරීමට උත්සාහ කරන්නේ නම් ඔබට පැමිණිල්ලක් කළ හැකිය.

සේවායෝජකයෙකු, සාප්පු හිමියෙකු, ගුරුවරයෙකු වැනි පුද්ගලයෙකුගෙන් හෝ අවන්හලක් හෝ රජයේ සංවිධානයක් වැනි සංවිධානයකින් හෝ සේවාවකින් වෙනස්කම් කිරීම සිදුවිය හැකිය.

නොමිලේ සහ රහසිගතව මානව හිමිකම් කොමිසමට පැමිණිල්ලක් සිදුකළ හැක. පැමිණිල්ලක් සිදුකිරීම පිළිඹඳ වැඩිදුර දැනගැනීමට, [tikatangata.org.nz](https://tikatangata.org.nz) ඔස්සේ අපගේ වෙබ් අඩවියට යන්න.

[තොරතුරු](#) ටි රියෝ මාඕරි, සැමෝවා, ටොන්ගන්, සාම්ප්‍රදායික චීන, සරල කළ චීන සහ හින්දි භාෂාවලින් මෙන්ම විශේෂිත, බ්‍රේල් ගොනුව, විශාල මුද්‍රණය සහ ශ්‍රව්‍ය වැනි ප්‍රවේශ විය හැකි ක්‍රමවලින්ද ලබා ගත හැකි ය.

He whakamana tangata.
සෑමට ගෞරවනීය ජීවිතයක්.

---

Ombudsman
Kaitiaki Mana Tangata

## Ombudsman | Kaitiaki Mana Tangata

මධ්‍යම රජය සහ පළාත් පාලන ආයතන ඇතුළු රජයේ ආයතන සමඟ ජනතාවට ගැටලු ඇති විට ඔම්බුඩ්ස්මන්වරයාට උදව් කළ හැකිය. උදාහරණයක් ලෙස, සමාජ සංවර්ධන අමාත්‍යාංශය, නවසීලන්ත ආගමන අමාත්‍යාංශය, ඔබේ දරුවාගේ පාසල සහ ඔබේ පළාත් පාලන ආයතනය.

ඔම්බුඩ්ස්මන්වරයා වෙත ප්‍රශ්නයක් යොමුකිරීම හෝ පැමිණිල්ලක් කිරීම නොමිලේ සිදුකළ හැකි අතර සෑම කෙනෙකුටම ලබා ගත හැකිය.

රජයේ ආයතනයක් ඔබ අසතුටු වූ, අසාධාරණ හෝ වැරදි යැයි සිතන තීරණ ගෙන ඇති බව හෝ ක්‍රියා කර ඇති බව ඔබ විශ්වාස කරන්නේ නම්, ඔබට ඔම්බුඩ්ස්මන්වරයාට පැමිණිලි කළ හැකිය. ඔබේ පැමිණිල්ල අවධානයෙන් සලකනු ලැබේ. ඔම්බුඩ්ස්මන්වරයා ඔබෙන් පළමුව ආයතනයට පැමිණිලි කරන ලෙස ඉල්ලා සිටිය හැකි අතර එය කරන්නේ කෙසේද යන්න පිළිබඳව උපදෙස් ලබා දිය හැකිය. ඔබේ ගැටළු මතු කළ හැකි වෙනත් ඕනෑම ක්‍රමයක් පිළිබඳව ඔම්බුඩ්ස්මන්වරයාට ඔබට දැනුම් දිය හැකිය. ඔම්බුඩ්ස්මන්වරයාට ඔබේ පැමිණිල්ල විසඳීමට හෝ එය විමර්ශනය කිරීමටද උදව් කළ හැකිය.

රජයේ ආයතනයක් ඔබට තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කරන්නේ නම්, ඔබට ඔම්බුඩ්ස්මන්වරයාට පැමිණිලි කළ හැකිය.

තම සේවා ස්ථානයේදී බරපතල වැරදි හෙළි කිරීමට කැමති අයට හෝ හෙළිදරව්වක් සිදු කිරීමේදී තමන් ආරක්ෂා වන්නේ කෙසේද යන්න පිළිබඳ උපදෙස් අවශ්‍ය අයට ඔම්බුඩ්ස්මන්වරයා උපකාර කරයි. ඔම්බුඩ්ස්මන්වරයාට හෙළිදරව් කිරීම් විමර්ශනය කිරීමට හෝ සලකා බැලීම සඳහා 'සුදුසු අධිකාරියකට' යොමු කිරීමට හැකිය.

ඔම්බුඩ්ස්මන්වරයා සම්බන්ධ කර ගැනීමෙන් ඔබට කරදරයක් සිදු නොවේ. ඔබේ ගැටලුව විසඳීමට උපකාර කිරීම සඳහා අවශ්‍ය නම් මිස, ඔම්බුඩ්ස්මන්වරයා ඔබේ ගැටලුව ගැන වෙනත් කිසිවෙකුට නොපවසයි.

ඔම්බුඩ්ස්මන්වරයා ස්වාධීන වන අතර නීති උපදෙස් ලබා නොදෙන අතර, නීතිඥයෙකු හෝ නියෝජිතයෙකු ලෙස කටයුතු නොකරයි.

## සම්බන්ධ වීම

ඔබට ප්‍රශ්න ඇත්නම් හෝ පැමිණිල්ලක් කිරීමට අවශ්‍ය නම් ඔම්බුඩ්ස්මන්වරයා සම්බන්ධ කර ගත හැක.

- **ගාස්තු රහිත අංකය:** 0800 802 602
- ඔම්බුඩ්ස්මන් වෙබ් අඩවියේ ඇති පැමිණිලි පෝරමය හරහා මාර්ගගතව **පිවිසෙන්න:** https://www.ombudsman.parliament.nz/ වෙත ගොස් '(සාමාන්‍ය ජනතාව) සහය ලබාගන්න' මත ක්ලික් කරන්න
- **ඊමේල්:** info@ombudsman.parliament.nz
- **තැපැල්:** The Ombudsman, PO Box 10152, Wellington 6143

විවිධ භාෂා සහ ආකෘතිවලින් ප්‍රයෝජනවත් සම්පත් සහ ප්‍රකාශන රාශියක් ඔම්බුඩ්ස්මන් වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.